**යටියන්තොට ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුල නිෂ්පාදනය කල කොම්පෝස්ට් පොහොර තොගය ගිණුම්ගතකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තත්ත්වය පිළිබිඹු කෙරෙන පරිදි ගිණුම්ගත කිරීම සිදු කළ යුතුය. | මීට පෙර ආරම්භක පොහොර තොගය ගණනය කිරීමේදී (අමු,නිමි,නොනිමි) තොගය තුළ නිෂ්පාදනය කළ පොහොර තොගය ගැලපීමක් සිදු නොකරන ලදී. |
| (ආ) | 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ ශේෂය වූ රු. 65,621 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට අපොහොසත්වී තිබූ අතර එම ශේෂය ගෙවිය යුතු ශේෂ යටතේ ගිණුම්ගත කර තිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | දෝෂය හඳුනා ගනිමින් නිවැරදි කිරීමට උත්සාහ ගන්නා බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සේවක ණය ශේෂයෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ සේවක ණය ලේඛනය අනුව ශේෂය අතර රු. 672,409 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුයි. | මූල්‍ය ප්‍රකාශන අගය සහ සේවක ණය සත්‍ය ශේෂය ගලපා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 17,134,210 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ වටිනාකම රු. 4,199,437 ක් වූ ලී බඩු සවිකිරීම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛන යාවත් කාලීන නොවීම නිසා මෙම ගැටළුව සිදු වී ඇති බව හඳුනා ගෙන ඇත. 2020 වර්ෂය තුල මෙම අගයන් සඳහා නිවැරදි උපලේඛන සකස් කර ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම්
--------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්
------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 (2) | 2006 සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 104,435 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් යොමු ගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී හැකි සියලු නිරවුල් කිරීම් සිදු කිරීමට සටහන් කර ගත් බව. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30 /2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය. | සභාව සතු වාහන 10 ක ඉන්ධන දහන පරීක්ෂාව නියමිත පරිදි සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී හැකි උපරිමයෙන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,175,128 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,301,488 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,614,228 | 5 ,010,974 | 4 ,993,213 | 808,734 | 4,959,036 | 4,959,036 | 4,257,495 | 790,972 |
| (ii) | කුලී | 8,134,800 | 6,607,001 | 6 ,424,937 | 385,736 | 5,759,118 | 5,759,118 | 5,648,196 | 203,671 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2 ,243,050 | 1,125,719 | 1 ,178,903 | - | 828,335 | 828,335 | 775,151 | 53,184 |
| (iv) | වෙනත් ආදායම් | 56,052,346 | 48,688,222 | 52,363,244 | 22,616,250 | 7,698,878 | 47,698,878 | 33,330,546 | 26,291,271 |

### 2.2.2 ඉඩම් බදු දීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වර්ෂයක කාලයක් ඉක්ම වූ සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවැති රු. 171,670 ක්වූ ඉඩම් බදුදීම් වලින් අයවියයුතු ආදායම සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර, ඉන් රු. 21,000 ක් 2017 වර්ෂයට පූර්ව අයවිය යුතු මුදල් විය. වර්ෂය තුල බිල්කල රු.95,565 ක මුදලින්ද රු.8750 ක් පමණක් අයවී තිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගත යුතුය. | මෙම වර්ෂය තුළ නිවැරදි කර ගැනීමට කටයුතු කල හැකි බව. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| යටියන්තොට සති පොළ අංක 2 දරන ආපන ශාලාව ටෙන්ඩර් කිරිමට නොහැකි වීමෙන් එයින් ලබාගත හැකිව තිබුණු ආදායම අහිමිව තිබුණි. | අඩුපාඩු හඳුනාගෙන ඒවා සකස් කර බදු දිමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව. |

2.2.4 දැන්වීම් පුවරු ගාස්තු ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| දැන්වීම් පුවරු ප්‍රදර්ශනය වෙනුවෙන් අයවියයුතු රු. 182,750 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ දී වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණයක් නිසි පරිදි සිදු කර ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට හැකි වන බව. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,018,625 ක් හා මුද්දර ගාස්තු රු. 14.191,037 ක් වූ අතර, වර්ෂයක කාලයක් ඉක්ම වූ අය නොවී පවතින ශේෂය රු. 8,534,602 ක් විය. | සභාව වෙත ලැබිය යුතු ආදායම් හදුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ලැබිය යුතු සියලු මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් සඳහා ඉල්ලීම් කර පළාත් සභාව වෙත යොමු කර ඇති බව. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණ පහත දැක්වේ.

ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ප්‍රගතිය දක්වන කාර්ය සාධන වාර්තා සභාව විසින් පිළියෙල කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම පිළිබඳ විගණනයට තහවුරුවක් නොවීය. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව ප්‍රගතිය දක්වන අයුරින් කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | මහජන පුස්තකාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හා යටියන්තොට පොදු වෙළඳපල ආසන්නයේ රථවාහන නැවතුම්පල සකස් කිරීමටත්, ඉතිරි මුදල් සභාවේ සංවර්ධන යෝජනා සඳහා යෙදවීමටත් රු. 5,000,000 ක්වූ ස්ථාවර තැන්පතුව 2019 පෙබරවාරි 28 දින නිදහස් කර ගෙන තිබුණද, පුස්තකාල ගොඩනැගිල්ලේ මූලික කටයුතු ප්‍රමාදවීම හේතු කොට ගෙන 2019 අගෝස්තු 15 දින එකී මුදල් නැවත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2019 පෙබරවාරි 28 දින සිට 2019 අගෝස්තු 15 දින දක්වා මාස 3 ක පොලිය වූ රු. 208,250 ක් නොලැබීම හේතුවෙන් සභාවට අලාභක් සිදුවී තිබුණි. | කාර්යයන් සැලසුම් කිරීම විධිමත්ව සිදුකර, නිසි වේලාවට අරමුදල් සපයා ගැනීම සිදුකළ යුතුය. | මෙවන් දෝෂයන් ඉදිරියේදී ඇති නොවීමට අභ්‍යන්තර දැනුවත් කිරීම් ක්‍රියාත්මක කර ඇති බව. |
| (ආ) | පළාත් පාලන චක්‍ර ලේඛ අංක 07/2010 හි 04 ඡේදය අනුව බල ප්‍රදේශය තුල පවතින බෙලිලෙන වැනි ඓතිහාසික ස්ථාන හා ගොඩනැගිලි පිළිබඳව ලේඛණයක් පවත්වාගෙන යාම හා එම ස්ථාන ඇතුලත් නිර්මිත පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2020 වර්ෂය තුළ වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කර ඇති බව. |
| (ඇ) | බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් ප්‍රදේශයේ පිහිටි දර්ශනීය ස්ථාන සංචාරක මධ්‍යස්ථාන වශයෙන් සංවර්ධනය කර, පොදු පහසුකම් ප්‍රවර්ධනය කර ආදායම් උත්පාදන මාර්ග බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොදු පහසුකම් ප්‍රවර්ධනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කල යුතුය. | ප්‍රාදේශීය සභාවේ ශක්තිය මත කළ හැකි ව්‍යාපෘති හඳුනාගෙන ඉටු කිරීමටත් වෙනත් ආයතනවලට යොමුකර ඉටු කර ගත හැකි කාරණා සඳහා එසේ යොමු වීමටත් කටයුතු කරන බව. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 5 ක් ඉක්මවූ ගෙවියයුතු ගිණුම්වල එකතු වටිනාකම රු.5,371,007 ක් විය. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂය තුළ නිදහස් කර ගැනීමට කටයුතු කරන බව. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | තනතුරු වර්ග 15 ක පුරප්පාඩු 26 ක් පැවති අතර එම පුරප්පාඩු 26 න් 11 ක් සඳහා අනියම් හා ආදේශක පදනම මත බඳවාගෙන තිබුණි. | නිසි පරිදි කාර්ය මණ්ඩල සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුරක් හා ඖෂධ සංයෝජක තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතත් ආයුර්වේද මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මහජන සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | ආයුර්වේද සේවාවන් ව්‍යාප්ත කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ඇ) | 1985 ජනවාරි සිට 2015 අගෝස්තු දක්වා කාලයට අදාල විශ්‍රාම ගිය, සේවය හැරගිය, හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් හා සේවකයන් 39 දෙනෙකුගෙන් අයවියයුතු රු. 184,856 ක ණය මුදලක් අයකර ගෙන නොතිබුණි. තවද ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (අ), (ආ) සහ (ඉ) ඡේදයන්හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සේවක ණය විෂය නඩත්තුව හා පාලනයේ දුර්වලතා නිසා ඇති වූ මෙම ගැටළු සඳහා විසඳුම් සොයා ගැනීමට උනන්දුවෙන් කටයුතු කරන බව. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| | ----------------------- | ------------ | -------------------------------- |
| (අ) | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ දී නාගරික ජනතාවට ගලි සේවාව ලබා දීමට නොහැකි වී නොතිබුණි. | නාගරික ජනතාවට අත්‍යාවශ්‍ය වන සේවාවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුය. | මෙම සේවාව යාවත්කාලීන කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ පවතින සුසානභූමි 51 ක් හඳුනාගෙන ඇතත්, ඒ පිළිබඳව සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ විධිවිධාන යටතේ සුසාන භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට, සුසානභූමි වශයෙන් පරිහරණය වන ඉඩම් පවරා ගැනීමට සුසානභූමිවල පරිපාලනය විධිමත් කිරිමට අතුරු ව්‍යවස්ථා පැනවීමට හා සියළු තොරතුරු ඇතුලත් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතුකර නොතිබුණි. | සුසාන භූමි හා මිනීපිටි ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මූලික හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසු ඉතිරි කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් නොතිබීම නිසා පෙන්වා දුන් තත්ත්වය ඇති වී ඇත. ඉදිරියේදී විධිමත් කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කරන බව. |

3.5 වත්කම් කළමනාකරණය

(අ) වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමටත්, සභාව සතු වත්කම් ආරක්ෂාකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |

(ආ) පවරා නොගත් වත්කම්

| | | |
|---|---|---|
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සහ සබරගමුව පලාත් සභාව මඟින් ලබාදෙන ලද වටිනාකම රු. 39,547,420 ක් වූ වාහන 13 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (i) ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. |

(ඇ) නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වටිනාකම රු. 4,124,600 ක් වූ වාහන 06 ක් වර්ෂ 04 සිට වර්ෂ 10 දක්වා කාල පරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවතිණි. | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (ආ) ඡේදය ප්‍රකාරව ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින වාහන අපහරණය කල යුතුය. | භාවිතා කළ නොහැකි හා භාවිතයෙන් ඉවත් කළ මෙම වාහන විධිමත්ව අපහරණය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 22 ක රු.3,178,312 ක මුළු ප්‍රතිපාදනයමද, වැය විෂයයන් 24 ක සියයට 50 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිය වූ රු.1,843,402 ක්ද වශයෙන් එකතුව රු.5,021,714 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත්, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. | අයවැය ඇස්තමේන්තුවේදී හා වියදම් කළමනාකරණය කිරීමේදී සිදුවී ඇති මෙම ගැටළුව ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. |